# ශ්‍රී ලංකාවේ විසංවාද මර්දනය

අප්‍රේල් 2014



හම්බන්තොට පිහිටි විශාල සංවර්ධන ව්‍යාපෘති දෙකක් පිළිබඳ විපක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නිරීක්ෂණ චාරිකාව ආවරණය කිරීමට ගිය ජනමාධ්‍යවේදීන් පොලිස් නිලධාරීන් බලා සිටියදී පාලක පක්ෂයේ ආධාරකරුවෙකුගේ බිත්තර ප්‍රහාරයකට ලක් වීම (ඡායාරූප - ලංකාදීප )


ඉන්ෆෝම් මානව හිමිකම් දත්ත කේන්ද්‍රය

informcolombo@gmail.com

## ආවරණය කළ සිදුවීම්

**අ. සිදුකළා යැයි කියන යුධ අපරාධ සම්බන්ධයෙන් වගකීම ඉල්ලා සිටින පුද්ගලයන්ව අත්තඩංගුවට ගැනීමට තර්ජනය කිරීම**

**ආ.** අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසට පහර දීම සහ සීමා පැනවීම

**ඇ.** සමාගමයේ නිදහසට පහර දීම සහ සීමා පැනවීම

**ඈ.** විශ්ව විද්‍යාල ශිෂ්‍ය ක්‍රියාකාරකම් මැඩපැවැත්වීම

**ඉ.** ආගමික නිදහස වෙනුවෙන් පෙනී සිටින මානව හිමිකම් ආරක්ෂකයන් ට තර්ජනය කිරීම

**ඊ.** මානව හිමිකම් ආරක්ෂකයන් ට සිරගත වූවන් බැලීමට යාම සීමා කිරීම

**එ.** විපක්ෂ දේශපාලන පක්ෂ මර්දනය කිරීම

*ඉන්ෆෝම් ආයතනය 1990 දී ආරම්භ කරන ලද්දේ විශේෂයෙන්ම වාර්ගික ගැටුම සහ යුද්ධය සන්දර්භයෙහි ශ්‍රී ලංකාවේ මානව හිමිකම් තත්ත්වය නිරීක්ෂණය කරමින් කරුණු ගොනු කිරීමටත් එම කරුණු ලිඛිත සහ වාචික මැදිහත්වීම් හරහා ප්‍රාදේශීයව, ජාතිකව සහ ජාත්‍යන්තරව වාර්තා කිරීමටත් ය. එසේම සිය අයිතීන් නිරන්තරයෙන් සහ ක්‍රමවත් ලෙස කෙලෙසීමට ලක්වන අනෙක් ජන ප්‍රජාවන් සමග ද ඉන්ෆෝම් ආයතනය කටයුතු කරයි. වර්තමානයේ දී ඉන්ෆෝම් ආයතනය මැතිවරණ නිරීක්ෂණය, මාධ්‍ය නිදහස සහ මානව හිමිකම් ආරක්ෂකයින් සම්බන්ධයෙන් සිය අවධානය යොමු කර තිබේ. ශ්‍රී ලංකාවේ කොළඹ පිහිටා ඇති ඉන්ෆෝම් ආයතනය දේශීය ක්‍රියාධරයින්, කණ්ඩායම් සහ ජාලයන් සමඟ මෙන්ම කලාපීය සහ ජාත්‍යන්තර මානව හිමිකම් ජාලයන් සමග සහයෝගයෙන් කටයුතු කරයි.*

## සාරාංශය

අප්‍රේල් මාසය ආරම්භවූයේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් කවුන්සිලය විසින් ශ්‍රී ලංකා රජයට සුභදායක නොවන යෝජනාවක් සම්මත කිරීමත් සමගයි. එනම්, ශ්‍රී ලංකාවේ මානව අයිතිවාසිකම් තත්ත්වය පිළිබද දොස් පැවරීමත්, කරන ලදැයි කියන යුධ අපරාධ සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට අන්තර්ජාතික නිරීක්ෂණ යාන්ත්‍රණයක් පිහිටුවීමටත් කළ යෝජනාවයි. මෙම යෝජනාව සම්මත වීමෙන් දිනකට පසු ශ්‍රී ලංකා රජය විසින් පළාත් දෙකක මැතිවරණ පැවැත්වීමට තීරණය කළේ සම්මත යෝජනාවෙන් අනතුරුව මහජන සහයෝය ලබා ගනීමේ අරමුණෙනි. කෙසේ වෙතත්, දේශපාලන සහ ආර්ථික වැදගත්කමකින් යුතු අගනගරය වන කොළඹ ඇතුළු බස්නාහිර පළාතේ ආන්ඩුවේ පදනම දුර්වල වූ අතර පසුගිය වසර දෙක තුළ විශාල යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති රාශියක් අත් දුටු, ජනාධිපතිවරයාගේ ගම් ප්‍රදේශය සහ පාලක සභාගයේ බල කොටුව වන දකුණු පළාතේ ද තත්ත්ත්වය එසේම විය.

ත්‍රස්තවාදය නැවත පණ ගැන්වීමට උත්සහ කළා යැයි පවසමින් උතුරු පළාතේ දමිල තරුණයන් තිදෙනෙක් වෙඩි තබා ඝාතනය කළ බව රජය ප්‍රකාශ කර සිටියේය. මෙම තරුණයන් සොයා කළ ගවේශනවලදී පුද්ගලයන් 69දෙනෙකු අත්තඩංගුවට ගෙන ඇති අතර ඉන් වැඩි පිරිසක් දමිල තරුණයන්ය. ඉන් පුද්ගලයන් 24 දෙනෙකු නිදහස් කළ බව ප්‍රකාශයට පත් කෙරුණු අතර මැයි මස 4 වන දින වන විටත් පුද්ගලයන් 45 දෙනෙකු රැදවුම් භාරයේ රදවා තැබිණි. අතුරුදන් වූවන් පිළිබද ඉදිරි පෙළේ හඩ නගන්නියක වන ජෙයකුමාරි මහත්මියද ඒ අතර විය.

විසම්මුතික අදහස් මැඩ පැවැත්වීම අප්‍රේල් මාසයේදී ද දිගටම ක්‍රියාත්මක විය. ප්‍රධාන විපක්ෂය වන එක්සත් ජාතික පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ඇතුළ ප්‍රධාන පෙළේ දමිල දේශපාලන පක්ෂයක් වන ද්‍රවිඩ ජාතික සන්ධානය, මන්නරමේ කතොලික සභාවේ බිෂොප්වරයා, බෞද්ධ පූජකවරයෙකු වන වටරැක්කේ විජිත යන අය එලෙස ඉලක්ක වූහ. උතුරේ දමිල ජනමාධ්‍යවේදීන් මෙන්ම දකුනේ සිංහල ජනමාධ්‍යවේදීන්ද ආරක්ෂක හමුදාවන්ගේ සහ රජයේ නිරන්තර ප්‍රහාරයන්ට ලක් විය. මේ අතරම, දැනට ක්‍රියාත්මක නොවන ප්‍රතිපත්ති උපුටා දක්වමින් ශ්‍රී ලංකාවේ බීබීසී වාර්තාකරු ගේ සදහා වීසා දීර්ඝ කිරීම ප්‍රතික්ෂේප කෙරුණි. කරන ලදැයි කියන යුධ අපරාධ සම්බන්ධයෙන් වගවීම ඉල්ලා සිටින පිරිස් බිය ගැන්වීම සහ ඔවුන්ට තර්ජනය කිරීම නොකඩවා සිදු විණි. ආරක්ෂක හමුදාවන්ගේ නව ආකාරයේ බිය ගැන්වීම් වලට යාපනය විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ට මුහුණ දීමට සිදු විය. රාජ්‍ය නොවන සංවිධාන වලට නව ආකාරයේ නීති සම්පාදනය කරන බව ජනාධිපතිවරයා ප්‍රකාශ කළ බවට වාර්තා පළ විය. ඒ අතරම ත්‍රස්තවාදයට සහය දෙන බව දක්වමින්, විදේශ රටවල ක්‍රියාත්මක වන දමිල සංවිධාන 16ක් සහ දමිල පුද්ගලයන් 424ක ගේ නම් ප්‍රසිද්ධියට පත් කළේ ඒ පිළිබදව පැහැදිළි සාක්ෂි නොමැතිවයි. ඉන් ඇතැම් සංවිධාන එල්.ටී.ටී.ඊ සංවිධානය පිළිබදව හිතවත් ආකල්පයක් හොබවන

බව පෙනෙන්නට තිබුණු අතර සෙසු සංවිධාන සිදු කළා යැයි කියන යුධ අපරාධ සම්බන්ධයෙන් රජයෙන් සහ එල්.ටී.ටී.ඊ සංවිධානයෙන් වගවීම ඉල්ලා සිටි පිරිස් විය.

මෙළෙස වාර්තා වූ සිදුවීම් සියල්ලම වාගේ පිටුපස රජයේ ඇමතිවරුන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, ආධාරකරුවන් සහ රජයේ අනුබල ලබන කණ්ඩායම් සිටින බව පෙනෙන්නට තිබුණි. ආගමික නිදහස සහ එකමුතුකම වෙනුවෙන් කතා කරන බෞද්ධ භික්ෂුවක් ඇතුළු විපක්ෂයේ දේශපාලඥයන්, ජනමාධ්‍යවේදීන් ප්‍රහාරයන්ට සහ තර්ජනයන්ට ලක් වෙද්දී පොලීසිය ඒ සම්බන්ධයෙන් හුදු නිරීක්ෂකයින් ලෙස සිටිමින් නිහඬ පිළිවෙතක් අනුගමනය කරන ලදී.

පසුගිය වර්ශයන්හි දී මෙන්ම අතර ඇතැම් සිදුවීම් සම්බන්ධයෙන් ඇසින් දැටු සාක්ෂි, වීඩියෝ දර්ශන සහ ඡායාරූප ඇතුළු ප්‍රමාණයවත් සාක්ෂි ප්‍රසිද්ධියට පත්ව තිබුණද එකී සිදුවීම් සම්බන්ධයෙන් විමර්ශණය කිරීමට සහ චෝදනා ගෙනු කිරීමට කිසිදු උනන්දුවක් හෝ අවශ්‍යතාවයක් ඇති බව පෙනෙන්නට තිබුනේ නැත.

## අ. සිදුකළා යැයි කියන යුධ අපරාධ සම්බන්ධයෙන් වගකීම ඉල්ලා සිටින පුද්ගලයන්ව අත්අඩංගුවට ගැනීමට තර්ජනය කිරීම

### 1. දෙමල ජාතික සන්ධානයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ පළාත් සභා මන්ත්‍රීවරයෙකුට තර්ජන



දෙමල ජාතික සන්ධානයේ මන්ත්‍රී වරුන් වන සුරේශ් ප්‍රේමචන්ද්‍රන් සහ එම්.ඒ සුමන්තිරන් 2014 මාර්තු 26 වන දින ජිනීවා මානව හිමිකම් කවුන්සිල පරිශ්‍රයෙහි ජනමාධ්‍යට අදහස් දක්වමින්. (ඡායාරූපය - එස්. දේශප්‍රිය )

සහාග රජයේ පාර්ශවකාර පක්ෂයක් වන ජාතික හෙළ උරුමයේ මාධ්‍ය ප්‍රකාශක සහ බස්නාහිර පළාත්සභා මන්ත්‍රීවරයෙකු වන නිශාන්ත ශ්‍රී වර්ණසිංහ අප්‍රේල් 10 වන දින පැවති මාධ්‍ය හමුවක් අමතමින් උතුරු පළාත් සභාවේ මන්ත්‍රීවරියක වන ඇන්තනී ශශිධරන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන සුරේශ් ප්‍රේමචන්ද්‍රන් සහ එම්.ඒ සුමන්තිරන් වහාම අත්අඩංගුවට ගන්නා ලෙස ප්‍රකාශ කර සිටියේය. එයට හේතු ලෙස දැක්වූයේ මේ තිදෙනා 2014 මාර්තු මාසයේ පැවැත්වුණු එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ 25 වන සැසියට සහභාගී වීම සහ යුධ අපරාධ පිළිබද අන්තර්ජාතික පරීක්ෂණයක් ඉල්ලා සිටීමයි[1]

### 2. අග රදගුරු රයාප්පු ජෝසප්

අන්තවාදී බෞද්ධ කණ්ඩායමක් වන බොදු බල සේනාව විසින් මන්නාරමේ කතෝලික අග රදගුරු වන රයාප්පු ජෝසප් අත්තඩංගුවට ගැනීමට රජයට අභියෝග කරන ලදී. අග රදගුරුතුමාට එරෙහි චෝදනාව වූයේ එල්.ටී.ටී.ඊ සංවිධානයට සහයෝගය දැක්වූ බවයි. නමුත්, ඒකීය ශ්‍රී ලංකාවක් තුළ දෙමළ ජනයාගේ ස්වයං නීර්ණ අයිතිය වෙනුවෙන් පෙනී සිටීම, සිදු කළා යැයි කියන යුධ අපරාධ සම්බන්ධයෙන් ජාත්‍යන්තර පරීක්ෂණයක් ඉල්ලා සිටීම සහ මානව අයිතිවාසිකම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය කෙරෙහි දක්වන ප්‍රසිද්ධ විවේචන මෙම තර්ජනයන්ට සැබෑ හේතු බව පෙනෙන්නට තිබුණි.

[1] http://www.hirunews.lk/81026/jhu-says-3-tna-members-should-be-arrested (Last accessed 19th May 2014)

### 3. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ යෝජනාව අනුව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය විසින් ආරම්භ කිරීමට නියමිත ජාත්‍යන්තර විමර්ශණයක් සදහා සහය දක්වන පිරිස්

සිලෝන් ටුඩේ පුවත්පතේ පළ වූ වාර්තාවක් අනුව ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍ය කෙහෙලිය රඹුක්වැල්ල කියා සිටියේ ජාත්‍යන්තර විමර්ෂණයක් හමුවේ සාක්ෂි දෙන පිරිස් ව්‍යවස්ථා විරෝධීව කටයුතු කළහොත් ඔවුන් පිළිබඳ නීතිමය පියවර ගන්නා බවයි.[2]. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට එවැනි විමර්ෂණයක් සඳහා සාක්ෂි ඉදිරිපත් කිරීම කළ නොහැක්කක් බවත් එසේ කළහොත් එය රටේ ස්වාධිපත්‍යය උල්ලංඝණය කිරීමක් බව හෙතෙම තව දුරටත් ප්‍රකාශ කර සිටියේය. ජාත්‍යන්තර විමර්ෂණ කමිටුවක් ඉදිරියේ සාක්ෂි දීම රාජ්‍ය ද්‍රෝහී කියාවක් බව පවසමින්, එසේ කරන පුද්ගලයන් සම්බන්ධයෙන් රාජ්‍ය රහස් පණත යටතේ නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බවත්, එවැනි පුද්ගලයන්ගේ ජාත්‍යන්තර දුරකතන ඇමතුම් සහ වීඩියෝ සාකච්ඡා අවහිර කිරීමට පියවර ගන්නා බවත් සිලෝන් ටුඩේ පුවත්පත වෙනත් මාධ්‍ය වාර්තා උපුටා දක්වමින් පෙන්වා දී තිබුණි. කෙසේ වුවත් අමාත්‍ය රඹුක්වැල්ල මේ පිළිබඳ අදහස් දැක්වීමෙන් වැළකී සිටියේය.

## ආ. අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසට පහර දීම් සහ සීමා පැනවීම්

### 4. දමිල පුවත් පත් සදහා නව වාරණයක් යෝජනා කිරීම

ආචාර්ය රොහාන් ගුණරත්න පුවත් පතකට සම්මුඛ සාකච්ඡාවක් ලබා දෙමින් “ ඉතාමත් භයානක කාලය අවසන් වී ඇති නමුත් ඉතිරි වී ඇති සුළු පිරිස නැවත කැරළි ගැසීමට සූදානම් වන බවත් ඔවුන්ගේ කටයුතු පිළිබඳ ඉතා සමීපව නිරීක්ෂණයක් සිදු කළ යුතුය. ඔවුන්ගේ ප්‍රචාරණ කටයුතු පිළිබඳ වැරදි තොරතුරු සහ සාවද්‍ය ප්‍රචාර මහජනතාව අතරට ගෙන නොයාමට දමිල පුවත්පත් වල කර්තෘවරුන් වගබලා ගත **යුතුය.**[3] **සිංගප්පූරුවේ** නන්යැන්ග් තාක්ෂණික විශ්ව විද්‍යාලයේ දේශපාලන ප්‍රචණ්ඩත්වය සහ ත්‍රස්තවාදය පිළිබඳ පර්යේෂණ ආයතනයේ ප්‍රධානියා වන රොහාන් ගුණරත්න මහතා ආරක්ෂක අමාත්‍යාංශයේ කටයුතු වලද නිරන්තර සම්පත්දායකයෙක්ද වෙයි. ඔහුගේ මෙම ප්‍රකාශය කරන ලද්දේ දමිල ඩයස්පෝරාවේ ක්‍රියාකාරී සංවිධාන ලැයිස්තුගත කිරීම සහ ශ්‍රී ලංකාව තුළ එල්.ටී.ටී.ඊ සංවිධානයේ කටයුතු පණ ගැන්වීමට උත්සහ දරන බවට චෝදනා එල්ල වූ සන්ධර්භයක් තුළයි. ඇතැම් විට මෙය දමිල ජනමාධ්‍ය විසින්, ත්‍රස්තවාදය මැඩ පැවැත්වීම වෙනුවෙන් යැයි පවසමින් යුධ සමයේ සහ ඉන් අනතුරුව රජය විසින් කරන ලද අපයෝජන නිරන්තරයෙන් විවේචන කිරීම නිසා කළ ප්‍රකාශයක් ද විය හැකිය. මෙය දමිල ජනමාධ්‍ය වල පැවැත්මට තර්ජනයක් සහ ජනමාධ්‍ය පූර්ණ යටත් කිරීමට නතු කිරීමට දරන ප්‍රයත්නයක් බව පෙනේ. කෙසේ වුවත් ඇතැම් ජනමාධ්‍ය මෙවැනි තර්ජනයන් මධ්‍යයේ වුවද ආරක්ෂක හමුදාවන් පිළිබඳ විවේචනාත්මක වීමට තැත් දරමින් සිටී.

### 5. උතුරේ දමිල පුවත්පත් වලට ආරක්ෂක හමුදා නිලධාරීන් අණ කිරීම

[2] http://www.ceylontoday.lk/51-61100-news-detail-govt-warns-against-testifying-before-unhrc-inquiry.html (Last accessed 19th May 2014)
[3] http://www.nation.lk/edition/interview/item/28174-ltte-overseas-network-should-be-dismantled-prof-gunaratna.html (Last accessed 19th May 2014)

ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම විස්සයි විස්ස ක්‍රිකට් ලෝක කුසලානය ජයග්‍රහණය කිරීමේ ප්‍රවෘත්තිය ප්‍රධාන පුවතක් ලෙස පල කරන මෙන් ආරක්ෂක හමුදාවන් උතුරේ දමිල පුවත් පත් වලින් ඉල්ලා සිටින ලදී. අප්‍රේල් 07 වන දින ආරක්ෂක හමුදා ප්‍රධානියෙක් පුවත්පත් කාර්යාල වලට දුරකතන ඇමතුම් ලබා දී මෙම ප්‍රවෘත්තිය ප්‍රධාන පුවතක් ලෙස පල කරන ලෙස ඉල්ලා සිටියේය.[4] මෙම සිදුවීම කර්තෘ ස්වාධීනත්වයට කළ ඇඟිලි ගැසීමක් බව පැහැදිලිවම පෙනෙන අතර උතුරේ පවතින දැඩි හමුදාකරණය සහ ජනමාධ්‍යයන්ට නිරන්තරයෙන් ප්‍රහාර එල්ල කෙරුණ පසුබිමක් තුළ මෙම සිදුවීම යම් ආකාරයක බිය වැද්දවීමක් ලෙසද සැළකිය හැකිය.

## 6. මාධ්‍යවේදී සිවඥානම් සෙල්වදීපන්ට ජනමාධ්‍යවිදියෙක්ට පහර දීම



රොහල් ගත වී සිටි ජනමාධ්‍යවේදී සිවඥානම් සෙලවදීපන් (ඡායාරූපය ICET)

අප්‍රේල් 14 වන දින යාපනය දිස්ත්‍රික්කයේ වඩමාරච්චි ප්‍රදේශයේදී දමිල නිදහස් ජනමාධ්‍ය වේදියෙකු වන සිවඥානම් සෙල්වදීපන් මහතා ප්‍රහාරයකට මුහුණු දුන්නේය. සිය නිවස බලා ගමන් කරමින් සිටියෙදී මෝටර් සයිකලයකින් පැමිණි නාදුනන පුද්ගලයන් දෙදෙනෙකු ගේ ප්‍රහාරයට මොහු ලක් විය. සිවඥනෙම් මහතා දිනපතා දමිල භාෂාවෙන් පළ කෙරෙන පුවත්පත් වන වීරකේසරී සහ තිනකුරල් යන පුවත්පත් වල වාර්තාකරුවෙකි. මේ සිදුවීමෙන් බරපතල තුවාල ලැබූ මොහු රෝහල ගත කෙරුණ අතර පොලිස් පැමිණිල්ලක්ද ගොනු කරන ලදී. [5]

## 7. කර්තෘ එස්.වී. සිවකුමාරන්ට මරණ තර්ජන සහ පුතියාවන් පුවත්පතට ප්‍රහාරයක් එල්ල කිරීම

4 https://www.srilankamirror.com/news/14339-north-newspapers-asked-to-take-cricket-win-as-lead-news (Last accessed 19th May 2014)

5 http://colombogazette.com/2014/04/15/tamil-journalist-attacked-in-jaffna/ (Last accessed 19th May 2014)

පාලක සභාග රජයේ පළාත් සභා මන්ත්‍රීවරයෙකුගේ මූලිකත්වයෙන් යුතු කණ්ඩායමක් අප්‍රේල් 10 වන දින පුතියාවන් පුවත් පත් කාර්යාලයට කඩා වැදී එහි කර්තෘ එස්.වී. සිවකරන් මහතා හට මරණ තර්ජන එල්ල කරන ලදී. මෙම පුවත්පත් කාර්යාලය පිහිටා ඇත්තේ මන්නාරම් ප්‍රධාන මාර්ගයේ චින්කඩෙ ප්‍රදේශයේය. සිවකුමාරන් මහතා විපක්ෂ දමිල දේශපාලන පක්ෂයක් වන ඉලංගෙෙ තමිල් අරසු කච්චි පක්ෂයේ තරුණ ශාඛාවේ ප්‍රධානියාද වේ. කර්තෘ වරයා ජනමාධ්‍යවලට ලබා දුන් ප්‍රකාශය අනුව මෙම මැර කණ්ඩායම විසින් පුවත්පත බොදාහැරීම වලක්වන බවට තර්ජනය කර කාර්යාලයට ගිනි තබා ඇත. පුතියාවන් පුවත්පත උතුරු පළාතේ මන්නරම දිස්ත්‍රික්කයේ අළුතින් ආරම්භ වූ දමිල පුවත් පතකි.[6]

## 8. කර්තෘ සමන් වගාරච්චි මහතාගෙන් පොලීසිය ප්‍රශ්න කිරීම




සමන් වගාරච්චි, ලක්බිම පුවත් පතේ ප්‍රධාන කර්තෘට සිය ධූරෙයන් ඉල්ලා අස් වීමට බල කරන ලදී. (ඡායාරූප - බීබීසී සංදේශය වීඩියෝවේ තිර දර්ශනයකි)

අප්‍රේල් 09 වන දින ලක්බිම පුවත්පතේ ප්‍රධාන කර්තෘවරයා වන සමන් වගාරච්චි මහතා අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ කැදවීමේ නියෝගක් ලැබී ඔහු දීර්ඝ ප්‍රශ්ණ කිරීම් වලට ලක් විය. මෙම ප්‍රශ්න කිරීමට මූලික වූයේ ආරක්ෂක අමාත්‍යංශ ලේකම් සහ ජනාධිපතිවරයාගේ සහෝදරයා වන ගෝඨාභය රාජපක්ෂ මහතාගේ බිරිද වන අනෝමා රාජපක්ෂ මහත්මිය සම්බන්ධයෙන් පළ වූ ඡායාරූප ශීර්ෂයක් සම්බන්ධයෙනි. ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වන නීතිඥයෝ සංවිධානය මේ පිළිබද අදහස් දක්වමින් මෙසේ කියා සිටියේ ය. "*මෙය රටෙහි පවතින් වර්තමාන තත්ත්වය පිළිබද හෙළිදරව්වකි. ඉතා සුළු කරුණක් වෙනුවෙන් ජාතික මට්ටෙම් පුවත්පතක කර්තෘවරයෙකු අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ ප්‍රශ්න කිරීම් වලට ලක් වෙත්දී, සිවිල් ජනයා මුහුණ දෙන ඉතා බරපත මූලික අයිතිවාසකම් කඩ වීම් සහ නීතියේ ආධිපත්‍ය කඩ වන සිදුවීම් බලයේ සිටින්නවුන්ගේ කිසිදු අවධානමකට ලක් නොවී යටපත් වී යයි. අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය මර්දනය කිරීම සහ*

[6] http://www.tamilnet.com/art.html?catid=13&artid=37163 / http://goo.gl/UMyG30 (Last accessed 19th May 2014)

*ජනමාධ්‍යවේදීන් බිය ගැන්වීමට කළ ක්‍රියාවක් ලෙස ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වන නීතිඥයෝ මෙම සිදුවීම හෙළා දකී ."*[7]

## 9. නියෝජ්‍ය කර්තෘ සුජිත් ප්‍රසන්න මහතා සේවයෙන් පහ කිරීම

ගෝඨාභය රාජපක්ෂ මහතාගේ බිරිද සම්බන්ධයෙන් පළ කළ ඡායාරූප ශීර්ෂය පදනම් කර ගනිමින් ලක්බිම පුවත් පතේ කළමණාකාරිත්වය විසින් පුවත් පතෙහි නියෝජ්‍ය කර්තෘ වරෙයකු වූ සුජිත් ප්‍රසන්න මහතා සේවයෙන් ඉවත් කරන ලදී. උක්ත ඡායාරූපයහි වූයේ ගෝඨාභය රාජපක්ෂ මහතාගේ බිරිද මහජන ආරක්ෂාව පිළිබඳ දෙපාර්තමේන්තු යටතේ පවතින සේවා වනිතා ආයතන මගින් සංවිධානය කළ අවුරුදු පොළක වෙළඳ කුටියකින් භාණ්ඩ මිලදී ගන්නා ආකාරයයි. මේ පිළිබඳ සමාව ඉල්ලා සිටීමට පුවත්පතට බල කෙරුණි. ලංකා වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමයට(SLWJA) කියා සිටියේ “හොර සල්ලි නෙමෙයිනේ“ යනුවෙන් පළ වූ මෙම ඡායාරූප ශීර්ෂය උපහාසාත්මක ශීර්ෂයක් බවයි.[8] මෙවැනි උපහාසාත්ම ජනමාධ්‍යකරණයන්, අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ විමර්ශනයට සහ ප්‍රශ්ණකිරීම් වලට ලක් විය යුතු යැයි සිතන පාලකයන් සිටීම පිළිබඳ ලංකා වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමය සිය කණගාටුව පළ කර සිටියේය.

## 10. ජනමාධ්‍යවේදීන්ට පහර දීම සහ පලවා හැරීම

විපක්ෂයේ මන්ත්‍රීවරුන් ගේ මාගම්පුර වරාය නිරීක්ෂනය චාරිකාව ආවරණය කිරීමට ගිය ජනමාධ්‍යවේදීන්ට බිය වැද්දවීම් වලට මෙන්ම කළහකාරී පිරිස් වල බිත්තර ප්‍රහාර වලට ලක් විය. මෙම කළහකාරී පිරිසට මූලිකත්වය ලබා දුන්නේ ප්‍රදේශයේ නගරාධිපතිවරයා වන එක්සත් ජනතා නිදහස් සන්ධානයේ දේශපාලඥයෙකි.[9] මෙම පිරිස් වඩ වඩාත් ප්‍රචණ්ඩ වීම නිසා චාරිකාව අතරමග නවතා දැමීමට මන්ත්‍රීවරුන්ට සිදු විය . මැර කණ්ඩායම විසින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සහ ජනමාධ්‍යවේදීන් පහර දෙමින් ඔවුන්ව පන්නා දමන ආකාර ඇතුළත් වීඩියෝ දර්ශන සහ ඡායාරූප ජනමාධ්‍ය ඔස්සේ ප්‍රචාරය විය.[10]

## 11. බීබීසී වාර්තාකරු චාර්ල්ස් හැවිලන්ඩ් මහතාගේ වීසා ප්‍රතික්ෂේප කිරීම

බීබීසී වාර්තාකරුගේ වීසා වසරක් සඳහා දීර්ඝ කිරීම රජය ප්‍රතික්ෂේප කළ අතර ශ්‍රී ලංකාවේ සිදු කළ ඔහුගේ වැඩ කටයුතු නිමා කිරීම සඳහා සුළු කාලයකට වීසා ලබා දුන්නේය. [11] මේ සිදුවීම පිළිබඳ මාධ්‍යට කරුණු පැහැදිළි කළ ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම් ආචාර්ය චරිත හේරත් මහතා ප්‍රකාශ කර සිටියේ හැවිලන්ඩ් මහතා විදේශීය ජනමාධ්‍යවේදීන් සඳහා වීසා ලබා දිය හැකි උපරිම කාල සීමාව වන වසර 5 ඉක්මවා සිටි බවයි. කෙසේ වුවත් වීසා ලබා දිය හැකි උපරිම කාල සීමාව ඇතුළත් වන ප්‍රතිපත්තිය හෝ එය සිදු වන්නේ කුමන නීතියක් යටතේද යන්න හෝ පැහැදිළි කිරීමට චරිත හේරත් මහතා අපොහොසත් විය. අදාල ප්‍රතිපත්තිය විදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ පවතින බැවින් ඒ පිළිබඳ තමාට කිසිවක් ප්‍රකාශ කළ නොහැකි බව ඔහු තව දුරටත්

---

7 http://www.ft.lk/2014/04/26/lawyers-for-democracy-condemn-the-harassment-of-lakbima-editor/ (Last accessed 19th May 2014)
8 http://lankanewsweb.net/news/7246-the-cid-questioning-of-lakbima-editor-saman-wagarachchi (Last accessed 19th May 2014)
9 http://www.sundaytimes.lk/top-story/48925.html (Last accessed 19th May 2014)
10 https://www.youtube.com/watch?v=d4Hacx6mXT0 (Last accessed 19th May 2014)
11 http://colombogazette.com/2014/04/19/bbc-correspondent-refused-a-visa/ (Last accessed 19th May 2014)

කියා සිටියේය. විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් වරයාගෙන් මේ පිළිබඳ විමසූ විට ඔහු කියා සිටියේ හෙතෙම මෙවැනි පණතක් පිළිබඳ නොදන්නා බව සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ එවැනි පණතක් තිබිය හැකි බවයි.[12] ඍජු පිළිතුරු දීමෙන් වැළකී සිටීම සහ වගකීම අමාත්‍යාංශ අතර හුවමාරුකර ගැනීම සහ අදාල පණත පිළිබඳ තොරතුරු හෙළිදරව් නොකිරීම යන කරුණු මත බීබීසී වාර්තාකරුගේ වීසා දීර්ග නොකිරීම හුදෙක්ම දේශපාලන තීරණයක් බව පෙනේ. එමෙන්ම මෙම පියවර ජනමාධ්‍ය නිදහසට අහිතකර පූර්වාදර්ශයක්ද වෙයි.

## 12. පූජ්‍ය වටරැක්කේ විජිත හිමි සහ සෙසු පුද්ගලන් - මාධ්‍ය හමුවට පහර දීම

බොදු බල සේනාව විසින් මෙහෙයවනු ලැබූ කලහකාරී පිරිසක් විසින් ජාතික බල සේනාව නම් වූ නව කණ්ඩායමේ ආරම්භක මාධ්‍ය හමුව කඩාකප්පල් කරන ලදී.[13] මෙම නව කණ්ඩායමේ ප්‍රධානත්වය හොබවන පූජ්‍ය වරැක්කේ විජිත හිමියන් සුළුතර ආගමික ප්‍රජාවන්ගේ අයිතිවාසිකම් පිළිබඳ කතා කිරීමත්, ආගමික එකමුතුභාවය ඇති කිරීමට කටයුතු කිරීමත් යන හේතු මත අප්‍රේල් 09 වන දින ප්‍රහරදීමකට සහ බිය වැද්දවීමකට ලක් විය.[14] බොදු බල සේනාවේ සාමාජිකයන් විජිත හිමියන්ට තර්ජනය කරන සහ බැණ වදින ආකාරය සහ ඉස්ලාම් පූජකවරුන්ට නිහඩ වන ලෙසට තර්ජනය කරන දර්ශන ඇතුළත් වීඩියෝ පට රූපවාහිනී නාලිකා ගණනාවක්ම ප්‍රචාරය කලේය.[15] මෙම අවස්ථාවට සහභාගී වී සිටි පොලිස් නිලධාරීන් මෙම කඩාකප්පල් කාරී ක්‍රියාව වළැක්වීමට නිසි පියවර ගත්තේ නැත.

# ඇ. සමාගමයේ නිදහසට පහර දීම සහ සීමා පැනවීම

## 13. රාජ්‍ය නොවන සංවිධාන - නිරීක්ෂණයට නව නීති

රාජ්‍ය නොවන සංවිධාන වලට ලැබෙන මූල්‍ය ආධාර නිරීක්ෂනය කිරීමට නව නීති සම්පාදනය කිරීමේ සූදානමක් ඇති බව අප්‍රේල් 24 වන දින කර්තෘවරුන් සමග පැවැත්වූ සාකච්ඡාවකදී ජනාධිපතිවරයා ප්‍රකාශ කළ බවට වාර්තා පළ විය. මෙම සිදුවීම පිළිබඳ සිලෝන් ටුඩේ පුවත් පත මෙසේ දක්වා තිබුණි. *"යෝජිත නව නීති මාලාව, රාජ්‍ය නොවන සංවිධාන නිරන්තර පහරදීම් වලට සහ ඒවායේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාකාරකම් මර්දනය කිරීමට යොදා නොගත යුතුය. ඇතැම් රාජ්‍ය නොවන සංවිධාන මගින් සංවිධානය කළ ඉතාමත් නිර්ව්‍යාජ ක්‍රියාකාරකම් පවා රජයේ බරපතල විශම සැළකීම් වලට ලක්වූ තත්ත්වයක් යටතේ මෙම නව නීති මාලාව සාකච්ඡාවට පිළිබඳ විස්තරාත්මක සාකච්ඡාවක් ගොඩනැගිය යුතුය.*[16]

---

[12] http://www.sundaytimes.lk/140420/news/bbcs-haviland-has-to-go-says-govt-93255.html (Last accessed 19th May 2014)
[13] http://colombogazette.com/2014/04/09/bbs-abuse-monk-and-muslim-cleric/ (Last accessed 19th May 2014)
[14] http://groundviews.org/2013/10/09/buddhist-monk-attacked-by-bodu-bala-sena-and-police-inaction/
[15] https://www.youtube.com/watch?v=pcbhAGG4VCM (Minutes 1.56 onwards - last accessed 19th May 2014)
[16] http://www.ceylontoday.lk/52-62465-news-detail-new-laws-against-ngos-should-not-be-a-witch-hunt.html (Last accessed 19th May 2014)

### 14. දමිල ඩයස්පෝරාවේ සංවිධාන සහ ඔවුන් සමග සම්බන්ධකම් පවත්වන ශ්‍රී ලාංකිකයන්

බාහිර (ජාත්‍යන්තර) කටයුතු පිළිබඳ අමාත්‍ය ජී.එල්. පීරිස් මහතා අප්‍රේල් 4 වන දින යුධමය වශයෙන් පරාජය කරනු ලැබූ එල්.ටී.ටී.ඊ සංවිධාන ඇතුළුව විදේශ රටවල ක්‍රියාත්මක වන සංවිධාන 16ක් තහනම් ලැයිස්තු ගතකොට ප්‍රසිද්ධියට පත් කළේය. මෙම නිවේදනය ආරක්ෂක අමාත්‍යංශ ලේකම්වරයා විසින් මාර්තු 20 වන දින අත්සත් තැබූවකි. මෙම ආයතන 16හි වත්කම් සහ මූල්‍යමය සම්පත් අත්හිටුවීමේ අරමුණෙන් මෙම නිවේදනය සිදු කළ බව පෙනිනි. හියුමන් රයිට්ස් වොච් ආයතන මෙම සිදුවීම පිළිබඳ මෙසේ අදහස් දක්වා තිබුණි. *“ශ්‍රී ලංකා රජයේ මෙම තීරණය රටේ සුළුතර දමිල ජනයාගේ සාමකාමී ක්‍රියාකාකම් වැළැක්වීමට ගත් පියවරකි.*[17]” රජය, ඉහත ලැයිස්තුවෙහි නම් කළ ආතයන විසින් සිදු කරනු ලබන නීති විරෝධී කටයුතු පිළිබඳ සාක්ෂි ඇත්නම් එවා ඉදිරිපත් කළ යුතු අතර එවැනි සාක්ෂි නොමැති ආයතන මෙම ලැයිස්තුවෙන් ඉවත් කළ යුතු බව හියුමන් රයිට්ස් වොච් ආයතන තවදුරටත් කියා සිටියේය.

මෙසේ නම් කළ එක ආයතනයක් වන ග්ලෝබල් ටැමිල් ෆෝරම් ආයතනයට පවසා සිටියේ ශ්‍රී ලංකා රජයේ මෙම තීරණය මගින් දමිල ඩයස්පෝරාවේ ක්‍රියාත්මක වන සංවිධාන 16ක්, ඩයස්පෝරාවේ ප්‍රමුඛ පෙළේ ක්‍රියාධරයන් සිවු දෙනෙක් තහනමට ලක කරන අතර මෙය, සිදු කළා යැයි කියන යුධ අපරාධ සම්බන්ධයෙන් සාධාරණය සහ වගවීම ඉල්ලා සිටින පුද්ගලයන් බිය වැද්දවීමටත්, දිගින් දිගටම සිදු වන මානව හිමිකම් කඩ වීම් සාධාරණීයකරණය කිරීමටත් ගත් පියවරක් බවයි. නම් කළ ක්‍රියාධරයන් සිවු දෙනා අතර ග්ලෝබල් ටැමිල් ෆෝරම් ආයතනයේ සභාපති ආචාර්ය එස්.ජේ. ඉමැනුවෙල් පියතුමාද වේ. ”[18]

## ඇ. විශ්ව විද්‍යාල ශිෂ්‍ය ක්‍රියාකාරකම් මැඩපැවැත්වීම

### 15. යාපන විශ්ව ශිෂ්‍යයන් - ආරක්ෂක හමුදාවන්ගේ බිය ගැන්වීම

ආරක්ෂක හමුදාවන් විසින් පිරිමි නේවාසිකාගර තුළ පුළුල් සෝදිසි මෙහෙයුම් ක්‍රියාත්මක කරන බව යාපන විශ්ව විද්‍යාල ශිෂ්‍ය සංගමය නිවේදනයක් නිකුත් කරමින් අප්‍රේල් 25 වන දා ප්‍රකාශ කළේය. පැහැදිළි හේතුවක් නොමැතිව ආරක්ෂක හමුදාවන් විසින් සිදු කරනු ලබන මෙම සෝදිසි මෙහෙයුම් නිසා ශිෂ්‍යයන් තුළ අනවශ්‍ය බියක් ගොඩනැගී ඇති බවත් ඔවුන් තව දුරටත් පෙන්වා දී තිබේ.[19] රජයේ ක්‍රියාකාරකම් විවේචනය කළ ශිෂ්‍යයන් අරමුණු කරගෙන මෙම සෝදිසි මෙහෙයුම් ක්‍රියාත්මක වන බව පෙනෙන්නට තිබේ.

## ඉ. ආගමික නිදහස වෙනුවෙන් කතා කරන මානව හිමිකම් ආරක්ෂකයන්ට තර්ජන එල්ල කිරීම

---

[17] http://www.hrw.org/news/2014/04/07/sri-lanka-asset-freeze-threatens-peaceful-dissent (Last accessed 19th May 2014)

[18] http://www.srilankabrief.org/2014/04/banning-tamil-diaspora-groups-in-sri.html#more (Last accessed 19th May 2014)

[19] See http://globaltamilnews.net/GTMNEditorial/tabid/71/articleType/ArticleView/articleId/106072/language/ta-IN/article.aspx for statement in Tamil and http://www.eyesrilanka.com/2014/04/26/jaffna-uni-students-union-condemns-search-of-residence/ for article quoting the statement in English (Last accessed 19th May 2014)

## 16. පූජ්‍ය වටරැක්කේ විජිත හිමි - රැස්වීමකට සහභාගීවීම වැළැක්වීම

වටරැක්කේ විජිත හිමියන්ට විරුද්ධව අප්‍රේල් 22 වන දින බොදු බල සේනාව මහියංගනය ප්‍රාදේශීය සභාව ඉදිරිපිට තවත් විරෝධතාවයක් සංවිධානය කළේය. එහිදී පාලක පක්ෂය වන එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් ප්‍රාදේශීය සභාවට තේරී පත් වූ මන්ත්‍රීවරයෙක් වන විජිත හිමියන්ට යම් කිසි ප්‍රහාරයක් එල්ල වේ යැයි බියෙන් එම ස්ථානයෙන් එම හිමියන්ව ඉවත් කිරීමට පොලීසියට සිදු විය.[20] වටරැක්කේ විජිත හිමියන් ජීවිත ආරක්ෂාව වෙනුවෙන් දිව යන ආකාරය ඇතුළත් වීඩියෝ දර්ශන YouTube හි නැරඹිය හැකිය. [21]



*බොදු බල සේනාවේ මැර කණ්ඩායමක ප්‍රහාරයෙන් ගැලවීමට දිව යන පූජ්‍ය වටරැක්කේ විජිත හිමියන්. (2014 අප්‍රේල් 9) – (ඡායාරූපය - you tube වීඩියෝ පටයේ තිර දර්ශනයක්)*

## 17. පූජ්‍ය වටරැක්කේ විජිත හිමි ලුහුබැඳීම

අප්‍රේල් 24 වන දින බොදු බල සේනාවේ බෞද්ධ භික්ෂූන් කිහිපදෙනෙක් ඇතුළු කළහකාරී පිරිසක් කර්මාන්ත සහ වාණිජ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයට බලහත්කාරයෙන් කඩා වැදුණේ වටරැක්කේ විජිත හිමියන් එහි සැඟවී ඇත්තැයි බැලීමටය. අමාත්‍යාංශයට අදාල අමාත්‍යවරයා මුසුලිම් භාක්තිකයෙකු වන අතර මෙම කඩාවැදීම සිදු වන අවස්ථාවේ ඔහු කාර්යාලයේ නොසිටියේය. මෙම කලහකාරී කණ්ඩායට පිටව ගියේ අමාත්‍යාංශ නිලධාරීන් සහ පොලීසිය විසින් විජිත හිමියක් අමාත්‍යාංශය තුළ නොමැති බව සහතික කිරීමේ අනතුරුවය. [22]

---

[20] http://colombogazette.com/2014/04/22/massive-demo-against-vijitha-thero/ (Last accessed 19th May 2014)
[21] https://www.youtube.com/watch?v=MHimUKSFJ2M See seconds 35 to 45 (Last accessed 19th May 2014)
[22] http://colombogazette.com/2014/04/23/bbs-mob-storms-rishads-ministry/ (Last accessed 19th May 2014)

## ඊ. මානව හිමිකම් ආරක්ෂකයින්ට සිරගත වූවන් බැලීමට යාම සීමා කිරීම

### 18. මන්නාරමේ අගරදගුරුතුමාට ආගමික වතාවන් සිදුකිරීමට සහ දමිල සිරකරුවන් මුණගැසීමට බාධා පැමිණවීම

මන්නාරමේ කතෝලික සභාවේ අගරදගුරුතුමා විසින් පැවැත්වීමට නියමිත වූ පාස්කු මංගල්ලායේ ආගමික වතාවත් වලට බාධා එල්ල විය. එමෙන්ම බන්ධනාගාර කටයුතු පිළිබද අමාත්‍ය චන්ද්‍රසිරි ගජධීර මහතාගේ දැනුවත් වීම යටතේ අනුරාධපුර රදවා සිටින දමිල සිරකරුවන් මැණගැසීමට ගිය අවස්ථාවේ කොළඹ සිටින් ඉහල නිලධාරීන්ගේ නියෝගය මත යැයි පවසමින් ඒ ප්‍රයත්නයද වළක්වා වන ලදී.[23]. **අනුරාධපුර අගරදගුරුතුමා මේ පිළිබද අදහස් දක්වමින් තව දුරටත් කියා සිටියේ මන්නාරමේ අගරදගුරු තුමා සමග** දීර්ඝ සාකච්ඡා නොපැවැත්වීමටත් කිසිදු ලිඛිත සටහනක් ලබා නොදීමටත් බන්ධනාගාර නිලධාරීන් විසින් සිරකරුවන්ට තරයේ උපදෙස් තී ඇති බවයි.

මෙම චාරිකාව සදහා පුනරුත්තාපන සහ අධිකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍ය චන්ද්‍රසිරි ගජධීර මහතාගේ අවසරය ලැබී තිබුණත් අප්‍රේල් 20 වන දින ආරක්ෂක අමාත්‍යංශය විසින් මෙම චාරිකාව වළක්වාලීමට නියෝග කර ඇති බව ටැමිල් නෙට් වෙබ් අඩවිය වාර්තා කර තිබුණි. [24] මෙම චාරිකාවේ අරමුණ වූයේ දමිල සිර කරුවන් 60 දෙනෙකු මුණ ගැසී ඔවුන්ට බලාපොරොත්තුවේ පණිවුඩ බෙදාහැරීම සහ පාස්කු දිනයේ ඔවුන් සමග කාලය ගත කිරීමත්ය.[25] උතුරේ දමිල ප්‍රජාව අතර ප්‍රමුඛ පෙළේ මානව හිමිකම් ආරක්ෂකයෙක් ලෙස කටයුතු කරන මන්නාරමේ අගරදගුරුතුමා නිරන්තරයෙන් දමිල සිර කරුවන් මුණගැසීමට කටයුතු කරන අතර පැහැදිළි සාක්ෂි නොමැතිව චෝදනා ගෙනු කිරීමට නොහැකි සිරකරුවන් නිදහස් කරන මෙන් හඩ නගමින් සිටින අයෙකි. අගරදගුරුතුමා රජයේ අමාත්‍යවරුන් හමුවේ මෙන්ම උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිසම ඉදිරියේද කතා කළ අයෙකි. ***"ශ්‍රී ලංකාවේ තද හදවත් ඇති පුද්ගලයන් සහ නිලධාරීන් සිටිනවා. එවැනි පුද්ගලයන් නිසා සිංහල සහ දමිල ජනයා අතර සමගිය සහ සන්ධානය ඇතිකිරීම තවමත් අපහසු තිබෙනවා. මෙම තත්ත්වය වෙනස් විය යුතු අතර පසුගිය කාලයේ අත් දුටු අශුභ සිදුවීම අමතක කර දමා සාධනීය ආකල්පමය වෙනසක් ඇති කර ගන්න අවශ්‍යයයි. එමෙන්ම මානව හිමිකම් වලට ගරු කරන්න අපි පටන් ගත යුතුයි. රටක් වශයෙන් ප්‍රතිසන්ධාන ක්‍රියාවලිය සදහා එකමුතු වීම ඉකාමත් අවශ්‍යයි"*** යනුවෙන් අගරදගුරුතුමා ප්‍රකාශ කළේය.[26]

## එ. විපක්ෂ දේශපාලන පක්ෂ මර්දනය කිරීම

### 19. විපක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් - තොරතුරු නිරීක්ෂනය වැළැක්වීමට පහරදීම සහ බිය ගැන්වීම

---

23 http://www.srilankabrief.org/2014/05/sri-lanka-there-are-reasons-to-beleive.html (Last accessed 19th May 2014)
24 http://www.tamilnet.com/art.html?catid=13&artid=37183 (Last accessed 19th May 2014)
25 ibid
26 ibid

හම්බන්තොට මාගම්පුර වරාය නිරීක්ෂණය කිරීමට ගිය ප්‍රධාන විපක්ෂය වන එක්සත් ජාතික පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කණ්ඩායමකට තර්ජනයන්ට සහ බිත්තර ප්‍රහාරයකට ලක් වීමට සිදු විය. මෙම පළාතේ නගරාධිපතිවරයා ද මෙම ප්‍රහාරය එල්ල කළ කණ්ඩායටමට ඇතුළත් විය. [27]




එක්සත් ජාතික පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රී අජිත් පෙරේරා ට මත්තල ගුවන්තොටුපළේදී පාලක පක්ෂයේ ආධාරකරුවෙක් තර්ජනය කරයි. (ඡායාරූප - ඩේලි මිරර්)

ප්‍රහාරක කණ්ඩායම තවදුරටත් ප්‍රචණ්ඩ වීම හේතුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී කණ්ඩායමට නිරීක්ෂණ චාරිකාව අතරමග නතර කොට නැවත කොළඹ බලා පැමිණෙන්නට සිදු විය. මැර කණ්ඩායම විසින් මන්ත්‍රීවරුන් පිරිසට තර්ජනය කරන, බිග ගැන්වීම සහ පන්නා දමන වීඩියෝ දර්ශන සහ ඡායාරූප ජනමධ්‍ය ඔස්සේ ප්‍රචාරයට විය. [28] මෙම සිදුවීම රජයේ සංවර්ධන ක්‍රියාදාමය විවේචනය කරන පිරිස් පිළිබඳ මහජනයා කෝප වීමක් නිසි සිදු වූ තත්ත්වයක් ලෙස ජනාධිති මහින්ද රාජපක්ෂ ප්‍රකාශ කළේය. මෙම සිදුවීම ප්‍රජාතන්ත්‍රවාදී විසම්මුතියක් පමණක් බව පෙන්වා දෙමින් රාජ්‍ය පාලිත ජනමාධ්‍ය විසින් ප්‍රහාරය සාධාරණීයකරණය කරන ලදී. .[29] ප්‍රහාරයට ලක් වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පස් දෙනා මාධ්‍ය හමුවක් පවත්වමින් ජනාධිපතිවරයා විසින් එල්ල කළ චෝදනා ප්‍රතික්ෂේප කළ අතර එක්සත් ජාතික පක්ෂයේ කිසිදු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් එවැනි ප්‍රකාශයක් සිදු කර

[27] http://www.sundaytimes.lk/top-story/48925.html (Last accessed 19th May 2014)
[28] https://www.youtube.com/watch?v=d4Hacx6mXT0 (Last accessed 19th May 2014)
[29] http://www.srilankabrief.org/2014/04/mob-rule-and-hambantota-doctrine.html#more (Last accessed 19th May 2014)

නැති බව කියා සිටියේය. මෙම සංවර්ධන ව්‍යාපෘති වංචාකාරී ආකාරයට සිදු වී ඇති බවත් එක්සත් ජාතික පක්ෂය යටතේ මෙවැනි සංවර්ධන කටයුතු විනිවිදභාවයකින් යුතුව සිදු බවත් ඔවුහු තවදුරටත් කියා සිටියහ. [30]
එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන්ට එල්ල කළ ප්‍රහාර වලින් පසු රාජ්‍ය පාලිත ඩේලි නිවුස් පුවත්පත හැර සෙසු දිනපතා ඉංග්‍රීසි පුවත්පත් තුනම යුක්තිගරුක සහ සාධාරණ පරීක්ෂණයක් ඉල්ලා සිටිමින් තදබල කතු වැකි පළ කළේය. (ඩේලි මිරර් පුවත් පතේ The horror of the '*Hambantota doctrine'*[31]; අයිලන්ඩ් පුවත් පතේ *Thugs and toys*[32]; සිලෝන් ටුඩේ පුවත් පතේ *A slap on the face of parliamentary democracy.*[33])

---

[30] http://www.dailymirror.lk/news/46058-unp-mps-dismiss-claims-made-by-mr.htm (Last accessed 19th May 2014)l

[31] http://www.dailymirror.lk/opinion/172-opinion/46082-the-horror-of-the-hambantota-doctrine-editorial.html (Last accessed 19th May 2014)

[32] http://www.island.lk/index.php?page_cat=news-section&page=news-section&code_title=55 (Last accessed 19th May 2014)

[33] http://ceylontoday.lk/52-61908-news-detail-a-slap-on-the-face-of-parliamentary-democracy.html (Last accessed 19th May 2014)